**සීමාසහිත ලංකා පොහොර සමාගම**

**කෘෂිකර්ම අමාත්‍යාංශය**

පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත

නියාමන රාජ්‍ය අමාත්‍යාංශය.

වසර 50 ක ඉතිහාසයක් ඇති සී/ස ලංකා පොහොර සමාගම කෘෂිකර්ම අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ පවතින පූර්ණ රජය සතු සමාගමකි. අප සමාගම රසායනික පොහොර ආනයනය, ගුණාත්මක මිශ්‍ර පොහොර නිෂ්පාදනය, අලෙවි කිරීම හා බෙදාහැරීම සිදු කරනු ලබයි. ශ්‍රී ලාංකික ගොවි ජනතාවගේ පොහොර අවශ්‍යතාවය සපුරාලීම සඳහා ආයතනයක් සතු විශාලතම බෙදාහැරීම් ජාලයක් හිමි රජයේ ප්‍රමුඛතම ආයතනය වේ.

සීමාසහිත ලංකා පොහොර සමාගමේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් සපුරාලන ගතික ප්‍රතිඵල කඩිනමින් ළඟාකර ගත හැකි බාහිර/ අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ප්‍රධාන අභ්‍යන්තර විගණක - (ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය - HM 1-1)

රැකියා විස්තරය

- පද්ධති, පාලන විධි සහ ක්‍රියාමාර්ග පිහිටුවීම සහ වැඩි දියුණු කිරීම.
- පවතින පද්ධති සහ පාලන විධි සමාලෝචනය කිරීම.
- සමාගම මඟින් හඳුන්වා දී තිබෙන විධිවිධාන, රෙගුලාසි, ක්‍රියාමාර්ග සහ ප්‍රතිපත්ති ආදී නියමයන්ට අනුගතව කාර්ය මණ්ඩලය කටයුතු කරනවාද යන්න සහතික කර ගැනීම.
- කලින් කලට නියමිත විගණන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ නියමිත දිනට ප්‍රගතිය වාර්තා කිරීම.
- විගණන නිර්දේශ මත පිහිටුවනු ලබන ක්‍රමෝපායන් සඳහා උපදෙස් ලබාදීම.
- කලින් කලට නියමිත තොග සමීක්ෂණ කටයුතු සිදු කිරීම.
- සභාපතිතුමා විසින් යොමු කරනු ලබන විගණන පැවරීම් සහ විශේෂ විමර්ෂණ භාර ගැනීම සහ පරීක්ෂා කර වාර්තා කිරීම.
- රජයේ විගණන අංශය, රේඛීය අමාත්‍යාංශය සහ බාහිර විගණකවරුන් සමග සම්බන්ධීකරණය කිරීම.
- විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පවත්වා සමාගමේ අභිවෘද්ධිය කඩිනමින් ළඟාකර ගතහැකි නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

**සුදුසුකම් / පළපුරුද්ද**

බාහිර අයදුම්කරුවන් සඳහා

- ICASL/ CIMA/ ACCA ගණකාධිකාරණ ආයතනයන්හි ආශ්‍රිත සාමාජිකත්වය හා මූල්‍ය හා/ හෝ විගණනය පිළිබඳ කළමනාකාර මට්ටමේ වසර 15 ක සේවා පළපුරුද්ද

  හෝ
- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ගණකාධිකරණ/ වාණිජවේදී උපාධිය සමත්වීම හා මූල්‍ය කළමනාකාරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම සමඟ උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසු මූල්‍ය හා විගණනය පිළිබඳ රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ වසර 15 ක සේවා පළපුරුද්ද.
- ඉංග්‍රීසි භාෂාව භාවිතය හා පරිගණක සන්නිවේදන තාක්ෂණය පිළිබඳව නිපුණත්වය අතිරේක සුදුසුකමක් සේ සැලකේ.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

සමාගමේ කළමනාකාර (MM 1-2) සේවා ගණයෙහි I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05ක විගණන ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**ඉහත තනතුර සඳහා වයස:**

අවුරුදු 35 – 55 ත් අතර විය යුතුය

**(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපානු ඇත)**

**වැටුප් පරිමාණය :** රු. 80,295/- 2,270/-x 15 = රු.114,345/- (HM 1-1- 2016)

(අංක 02/2016 (1) දරණ කළමණාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව)

**වෙනත්:**

සෑම ඉල්ලුම්කරුවකුම

i. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා පෞරුෂත්වයකින් හෙබි ක්‍රියාශීලි පුද්ගලයකු විය යුතුය.
iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**ඉහත තනතුරු සඳහා වැටුපට අමතරව පහත සඳහන් වරප්‍රසාද හිමි වේ.**

- රජයේ අනුමත දීමනාවන්.
- සේවක අර්ථ සාධක අරමුදල (EPF)සඳහා සමාගම විසින් 15% දායකත්වයක් ලබා දෙන අතර, සේවක භවතාගේ දායකත්වය 10%කි.
- සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල (ETF) සඳහා සමාගම විසින් සේවක භවතාගේ වැටුපෙන් 3% ක දායකත්වයක් දරනු ලබයි.
- සේවා හා සේවක දෙපාර්ශවයේ දායකත්වයෙන් සේවක භවතා හා පවුලේ සාමාජිකයන් ඇතුලත් වන පරිදි වෛද්‍යාධාර රක්ෂණ යෝජනා ක්‍රමයේ දායකත්වය.
- රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 1/2015 අනුව අනුමත කල ඉන්ධන දීමනාව සමඟ වෙන්කල වාහනයක්/ ප්‍රවාහන දීමනාවක් හිමිවේ.
- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ අංක 05/2017 ප්‍රකාරව වෘත්තීය දීමනාවක් හිමිවේ.
- රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 2/2015 අනුව දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම.

**අයදුම්පත් යොමු කිරීම:**

ඉහත සුදුසුකම් සපුරා ඇති අභ්‍යන්තර අයදුම්කරුවන් විසින් එකී සුදුසුකම් සඳහන් කර අයදුම්පතක් 2021.05.31 දිනට පෙර මා වෙත ලබාදීමට කටයුතු කරන ලෙස දන්වමි.

- බාහිර අයදුම්කරුවන් ජීව දත්ත තොරතුරු ඇතුලත්ව නිසි පරිදි පිළියෙල කරන ලද අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික කරන ලද සහතික පිටපත් සමඟ **2021.05.31** දින හෝ දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් **(ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ තමා අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කර)** අප වෙත ලැබීමට සැළැස්විය යුතු අතර, දැනට රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා, රජය සතු සමාගම්වල සේවයේ නියුතු සේවක භවතුන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානි මගින් යොමුකල යුතුය.

  **අයදුම්පත් යොමුකල යුතු ලිපිනය:**

  සභාපති,
  සී/ස ලංකා පොහොර සමාගම,
  ලක්පොහොර ස්වර්ණ ජයන්ති මාවත,
  හුණුපිටිය,
  වත්තල.
- ඉහත පරිදි යොමු කරනු ලබන අයදුම්පත් හා සහතිකවල පිටපත් Chairman@lakpohora.lk යන ඊ මේල් ලිපිනය වෙතද යොමු කළ යුතු අතර, ඊ මේල් යොමු කිරීමේදී Subject තීරුවෙහි ඔබ අයදුම් කරන තනතුර සඳහන් කල යුතුය. අසම්පූර්ණ හෝ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.